# රිච්මන්ඩ් විද්‍යාලය Richmond College

## පළමු වාර පරීක්ෂණය - 2018

## බුද්ධ ධර්මය

3 ශ්‍රේණිය

නම / අංකය.....................................................  කාලය - පැය 01 වි.15

**සියලු ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.**

(01) නිවැරදි පිළිතුරු තෝරා යටින් ඉරක් අඳින්න.

(1) සිදුහත් කුමාරයාට ශිල්ප ඉගැන්වූයේ

(1) අසිත තාපසතුමා  (2) සර්වමිත්‍ර පඬිතුමා

(3) නන්දිමිත්‍ර තාපසතුමා

(2) සිදුහත් කුමාරයාගේ පියා

(1) බ්‍රහ්ම දත්ත රජු  (2) සුද්ධෝදන රජු

(3) එළාර රජු

(3) පිය රජතුමා සිදුහත් කුමරුට දෙවනුව වැන්දේ

(1) වප්මගුල් උත්සවයේ දී  (2) අකුරු කියවීමේ උත්සවයේ දී

(3) හිසකෙස් කැපීමේ උත්සවයේ දී

(4) "විශ්වා මිත්‍ර" යන නමින් හැඳින්වූයේ

(1) සිදුහත් කුමරා  (2) සර්වමිත්‍ර පඬිතුමා

(3) සුද්ධෝදන රජු

(5) සිදුහත් කුමරා ඉගෙන නොගත් දෙයක් වන්නේ

(1) කඩු ශිල්ප  (2) සතුන් දඩයම

(3) දුනු ශිල්ප

(6) භික්ෂූන් වහන්සේලා වෙත පනවා තිබෙන ආසන වල ගිහියන් ඉඳ ගැනීම

(1) කුසල කර්මයකි  (2) අකුසල කර්මයකි

(3) පින්වත් ක්‍රියාවකි

(7) පන්සලට යන විට සිදු කළ යුතු දෙයක් වන්නේ

(1) පාවහන් ගැලවීම  (2) හිස්වැසුම් පැළඳීම

(3) පාට ඇඳුමින් සැරසීම

(8) දොහොත් මුදුන් තබා වඳින විට දෑත්
(1) පපුවේ වැදිය යුතුය (2) නළලේ වැදිය යුතුය
(3) දෑත් එකිනෙක නොගෑවිය යුතුය

(9) තිසරගේ තුන් වන උපන්දිනය සමරා ඇත්තේ
(1) නිවසේ දානමය පිංකමක් පැවැත්වීමෙනි (2) සෙත් පිරිත් සජ්ඣායනය කිරීමෙනි
(3) උපන් දින සාදයක් පැවැත්වීමෙනි

(10) සිදුහත් කුමරා ශිල්ප උගත්තේ
(1) පන්සලේ දී (2) රජමාළිගයේ දී
(3) ගසක් යට දී

(11) වප් මඟුල් දින සිදුහත් කුමරු වඩන ලද භාවනාව
(1) ආනාපානසති භාවනාව (2) මෛත්‍රී භාවනාව
(3) පිළිකුල් භාවනාව

(12) රන්දි දුව අවදි වුණු ගමන් සිදු කරන්නේ
(1) මුහුණ සේදීමයි (2) වතුර වීදුරුවක් පානය කිරීමයි
(3) ආහාර ගැනීම

(13) රන්දි දුව දෙමාපියන්ට
(1) කීකරුයි (2) අකීකරුයි
(3) ගරු නොකරයි

(14) දෙමාපියන්ගේ දෙපා නැමදීම
(1) යහපත් දෙයකි (2) අයහපත් දෙයකි
(3) ඉතා නරක පුරුද්දකි

(15) භික්ෂුන් වහන්සේලා දුටු විටම සිදු කළ යුත්තේ
(1) වැඳීමයි (2) නැගිටීමයි
(3) ඉඳ ගැනීමයි

(16) වප් මඟුල් උත්සවයට ගිය පිරිස සිදුහත් කුමරු නිදි කළේ
(1) බෝ ගසක් යට සැදූ යහනාවකයි (2) දඹ ගසක් යට සැදූ යහනාවකයි
(3) නා ගසක් යට සැදූ යහනාවකයි

(17) හොඳ ළමුන් දිනපතා

(1) අටසිල් සමාදන් වෙයි (2) පන්සිල් සමාදන් වෙයි

(3) කිසිවක් සිදු නොකරයි

(18) වෙනත් ආගම්වල පූජකවරුන්ට ගරු කිරීම

(1) අපේ යුතුකමකි (2) අපේ යුතුකමක් නොවේ

(3) නරක පුරුද්දකි

(19) මාලා දුක්වුණේ

(1) බමුණා මාලා දාස භාවයෙන් නිදහස් කළ නිසා

(2) ස්වාමි දුව හිරිහැර කළ නිසා

(3) මිහිරි වචන කී නිසා

(20) බුදුරජාණන් වහන්සේගෙන් ධර්මය ඇසීම නිසා මාලා දාසිය

(1) පැවිදි වුණා (2) සෝවාන් වුණා

(3) ජීවිතය කල කිරුණා

(2 x 20 = 40)

**(02)** රන්දි දුව දවස ගත කළ ආකාරය පිළිවෙලින් අංක යොදන්න.

(1) උදේ ආහාරය ගැනීම ( )

(2) වතුර වීදුරුවක් පානය කිරීම ( )

(3) පාසලට පැමිණීම ( )

(4) පාන්දර අවදි වීම ( )

(5) පන්තිය හා අවට පිරිසිදු කිරීම ( )

(5 x 2 = 10)

**(03)** සුදුසු වචන තෝරා හිස්තැන් පුරවන්න.

(1) සිදුහත් කුමරු (සේවිකාවන්ට / කිරිමව්වරුන්ට) භාර දී සුද්ධෝදන රජතුමා නැකතට කුඹුරට බැස්සා.

(2) සුද්ධෝදන රජතුමා "පුතුනි ඔබට මේ මාගේ (දෙවන / තෙවන) වැඳීමය" කියා පුත් කුමරුට වැන්දා.

(3) ඇදුරුතුමනි අද සිට ඔබයි මාගේ පුතාගේ ගුරුතුමා. පුතාට (බුදු වීමට / සක්විති රජ) වීමට අවශ්‍ය ශිල්ප උගන්වන්න.

(4) දියණිය (මාලා / රජ්ජුමාලා) දිවි තොර කර ගන්න එපා. මා වෙතට එන්න.

(5) පන්සලට යන සඳ

..............................................................................

සුදු ඇඳුමින් නිබඳ

සැරසිලා ගොස් කරමු මුනි පුද (5 x 2 = 10)

(04) පහත සඳහන් ශාසනික වචන වල තේරුම ලියන්න.

(i) අමදිනවා - ..............................................................

(ii) පැන් - ..............................................................

(iii) සැතපෙනවා - ..............................................................

(iv) වඩිනවා - ..............................................................

(v) ධෝවනය කරනවා - ..............................................................

(2 x 5 = 10)

(05) කෙටි පිළිතුරු ලියන්න.

(1) මාලා දාසකම කළේ කුමන ගෙදරක ද? ..............................................................

(2) මාලාට හිංසා සිදු කළේ කවුද? ..............................................................

(3) ලණු මාලය නිසා මාලා හැඳින්වූයේ කුමන නමකින් ද? ..............................................................

(4) මාලාට පිහිට වූයේ කවුද? ..............................................................

(5) තමන්ට හිංසා කරන අයට මාලා සිදුකළේ කුමක් ද? ..............................................................

(5 x 2 = 10)

(06) සිදුහත් කුමාරයා ඉගෙනගත් දේවල් 4ක් ලියන්න.

(i) ..............................................................

(ii) ..............................................................

(iii) ..............................................................

(iv) ..............................................................

(2 x 4 = 8)

(07) බුද්ධ වන්දනාව සඳහා පිළියෙල කර ගත යුතු දේවල් 4ක් ලියන්න.

(i) ..............................................................

(ii) ..............................................................

(iii) ..............................................................

(iv) ..............................................................

(2 x 4 = 8)

(08) ඔබේ උපන් දිනය වෙනුවෙන් කළ හැකි යහපත් වැඩ 2ක් ලියන්න.

(i) ..............................................................

(ii) ..............................................................

(2 x 2 = 8)

PAST PAPERS WIKI